රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 05/92

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1992 ජනවාරි මස 27 වෙනි දින.

**සියළුම:** අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිසාපතිවරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්රුන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන් සහ
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් වෙත.

**<u>රජයේ නිලධාරීන්, නිලධාරිනියන් වැන්දඹු අනත්දරු හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ක්‍රමයට බඳවා ගැනීම.</u>**

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනතට අනුව, සෑම රජයේ නිලධාරියකුම විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත් වූ දින සිටම වැන්දඹු අනත්දරු ක්‍රමයෙහි සාමාජිකයෙකු වීම අනිවාර්ය වේ. රජයේ නිලධාරිනියන් 1983.08.01 වන දින හෝ ඊට පසු විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත් වන්නේ නම්, වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමයට සාමාජිකවීම අනිවාර්ය වේ. 1983.08.01 දිනට පෙර විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත් වුන නිලධාරිනියකට තමාගේ මනාපය පරිදි මෙම ක්‍රමයට දායක වීමට හෝ නොවීමට ඉඩ දී ඇත.

02. මෙහි දී සාමාජිකවීම සඳහා මාස තුනක් ඇතුළත මූලික ප්‍රකාශනයක් හා එයට අදාල ලියවිලි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු බව, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 21 වන වගන්තියෙන් හා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 5 වන වගන්තියෙන් අනිවාර්යය කොට ඇත.

03. කරුණු මෙසේ වුව ද, විශ්‍රාම ගන්නා තෙක්ම බොහෝ නිලධාරීන්/ නිලධාරිනියන් සාමාජික අංකයක් ලබාගැනීම ප්‍රමාද කරන බව පෙනී යයි. විශ්‍රාම වැටුප් අයදුම්පත පිළියෙළ කිරීමට වැන්දඹු අනත්දරු හෝ වැන්දඹු පුරුෂ අනත්දරු ක්‍රමයට සාමාජිකවීමේ අංකය අවශ්‍ය වන බැවින් විශ්‍රාම වැටුප් සකස් කිරීමේ අනවශ්‍ය ප්‍රමාදයන් ද මේ නිසා ඇති වී තිබේ. එමෙන්ම සේවයේ යෙදී සිටිය දී මිය යන නිලධාරීන් හා නිලධාරිනියන් සම්බන්ධයෙන් මෙම ක්‍රමය යටතේ අර්ථලාභීන්ට විශ්‍රාම වැටුප් සකස් කිරීමේදී ද මෙම සාමාජික අංක ලබා නොගැනීම වැන්දඹු හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් සැකසීම ප්‍රමාද වීමට හේතු වී තිබේ.

04. කරුණු මෙසේ හෙයින් විශ්‍රාම වැටුප් සහිත තනතුරු සඳහා රජයේ සේවයට බඳවා ගනු ලබන මුල් දිනයේ දී ම, නිලධාරීන් සඳහා පොදු 86 ආකෘති පත්‍රය ද, නිලධාරිනියන් සඳහා පොදු 86 ඒ ආකෘති පත්‍රය ද නිසිලෙස පුරවා ලබාගෙන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යාලයේ ලේකම් සහ ගණකාධිකාරී වෙත නොපමාව යැවීමට අදල බලධාරීන් විසින් කටයුතු කළ යුතුය.

අ.කලේ/ (ආර්.අබේරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.